# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 22 දරන
# දේශීය ආදායම්
# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 ජූනි මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 ජූනි මස 15 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : රු. 1.50 යි.

තැපැල් ගාස්තුව : රු. 1.55 යි.

# 1990 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 ජූනි මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 50/89

## 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1990 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — *ලුහුඬු නාමය.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — *1979 අංක 28 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) ඒ ඡේදයේ (LIV) වන අනුඡේදයේ "ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ලාභ සහ ආදායම සහ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ලාභ සහ ආදායම ;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ ඡේදයේ (LV) වන අනුඡේදයේ (III) වන විෂය යෙහි "භාර අරමුදලේ ලාභ සහ ආදායම්." යන වචන වෙනුවට "භාර අරමුදලේ ලාභ සහ ආදායම්; සහ" යන වචන ආදේශ කිරීමෙන්; තවද

(3) ඒ ඡේදයේ අන්තිමට පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන් :—

"(LVI) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂි කර්ම රක්ෂණ පනතින් පිහිටුවන ලද කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ ලාභ සහ ආදායම.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (අ) ඡේදයේ (XVI) වන අනුඡේදයේ "යම් දේපළක් අත්කර ගැනීමෙන් පසුව අවුරුදු විසි පහකට නොඅඩු කාලයකට පසුව" යන වචන වෙනුවට "යම් දේපළක් අත්කර ගැනීමේ දිනයෙන් අවුරුදු විසිපහකට නොඅඩු කාලයකට පසුව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — *ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — *ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) ඒ වගන්තියේ (ඈඈඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඈඈඈඈ) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් ජාතික ක්‍රීඩා සංගමයක් විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත දී, 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී, ඒ සංගමය විසින් ඉටු කරන ලද සේවාවන් සම්බන්ධයෙන්

2—ඩී 008701—6,210 (90/03)

හෝ ක්‍රීඩා පනතේ අර්ථානුකූල යම් ක්‍රීඩා වකට සහභාගි වන අතරතුර ඒ තක්සේරු වර්ෂයේ දී, විදේශීය ව්‍යව හාර මුදලින් උපයන ලද ලාභ සහ ආදායම (ශ්‍රී ලංකාවෙන් පිටත දී දරන ලද යුක්ති සහගත වියදම් යයි කොමසාරිස් ජනරාල් වරයා විසින් සලකනු ලබන මුදලක් අඩු කිරීමෙන් පසු) ඒ සංගමය විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබුවහොත්, ඒ ලාභ සහ ආදායම ; " ;

(2) ඒ වගන්තියේ (ත) ඡේදයේ "අරමුදලින් තැනැත්තකුට ලැබුණු යම් මුදලක්." යන වචන වෙනුවට "අරමුදලින් තැනැත්තකුට ලැබුණු යම් මුදලක් ; " යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (ද) ඡේදයේ "අරමුදලින් තැනැත්තකු විසින් ලද යම් මුදලක් " යන වචන වෙනුවට "අරමුදලින් තැනැත්තකු විසින් ලද යම් මුදලක් ; සහ" යන වචන ආදේශ කිරීමෙන්; තවද

(4) ඒ වගන්තියේ (ද) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(න) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදේශීය සේවානියුක්ති නියෝජ්‍යායතන යක ව්‍යාපාරය කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය ලබා දෙනු ලැබූ හෝ සලසා දෙනු ලැබූ යම් ශ්‍රී ලාංකිකයකු වෙනුවෙන් 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී එකී කාර්යාංශය විසින් ගෙවන ලද මුදලක රුපියල් දෙදහසක් නොඉක්ම වන කොටස.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තිය සංශෝධනය කිරීම.**

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තියේ (1) වන උපවගන්තියේ " 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව 1990 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව 1991 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 ඇඇඇ අලුත් වගන්තියක් ඇතුළත් කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇඇ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 22ඇඇඇ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:—

“අවදානම් ආයෝජන ප්‍රාග්ධනය සලස්වන රක්ෂණ සමාගම්වල ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

22ඇඇඇ. (1) (2) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් (2) වන උපවගන්තියේ සඳහන් යම් සමාගමක් ලබන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන ලාභ සහ ආදායම් නොවන) 3 (අ) වගන්තියේ අර්ථානුකූල ලාභ සහ ආදායම, ඒ සමාගම ව්‍යාපාරය ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට අවුරුදු දහයක කාලයක් ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමකින් අමාත්‍යවරයා විසින් මේ වගන්තියේ කාර්යය සඳහා අනුමත කරනු ලැබුවා වූ ද බඩු නිෂ්පාදනය කිරීමෙහි හෝ අපනයනය කිරීමෙහි නිරත වන ව්‍යවසායවලට පමණක් අවදානම් ආයෝජන ප්‍රාග්ධනය සැලැස්වීමේ ව්‍යවසායක් පවත්වාගෙන යාමෙහි නිරත වන්නා වූ ද සමාගම කට (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ (ii) ඡේදයේ “1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු යම් තැනැත්තකු විසින් අත්කර ගනු ලැබ,” යන ඉලක්කම් සහ වචන වෙනුවට “1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1987 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව යම් තැනැත්තකු විසින් අත්කර ගනු ලැබ” යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (iii) ඡේදයේ—

(අ) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයේ—

(i) “1987 අප්‍රේල් මස 1 වන දින හෝ” සිට “යම් තැනැත්තකු” දක්වා ඇති සියලු ඉලක්කම් සහ වචන වෙනුවට “එම තැනැත්තා විසින් ඉදිකරනු ලැබුවා වූ ද 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ඉදිකිරීම සම්පූර්ණ කරනු ලැබුවා වූ ද යම් සුදුසුකම් ලත් ගොඩනැගිල්ලක් එම තැනැත්තා” යන වචන සහ ඉලක්කම් සහ;

(ii) "අනුප්‍රමාණ අනුව දීමනාවක්" යන වචන වෙනුවට "අනුප්‍රමාණ අනුව දීමනාවක් ;" යන වචන

ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(iv) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එම තැනැත්තා විසින් අත්කර ගන්නා ලද, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ අර්ථානුකූලව ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය දේපළක් සංයුක්ත වන්නා වූ නිර්නේවාසික ඉඩ පහසුකම් ඒකකයක් සම්බන්ධයෙන් ඔහු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක එය ප්‍රයෝජන යට ගැනීමේ දී ගෙවීයාමෙන් උද්ගතවන ක්ෂයවීම සඳහා එය අත්කර ගැනීමේ වටිනා කම මත වර්ෂයකට සියයට දහයක අනු ප්‍රමාණය අනුව දීමනාවක් ;" සහ

(ඇ) ඒ ඡේදයේ අතුරු විධානයේ "(iii) වන අනුඡේද යෙහි හෝ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(iii) වන අනුඡේදයෙහි හෝ (iv) වන අනුඡේද යෙහි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරී මෙන් ; තව ද

(3) ඒ උපවගන්තියේ (ඖ) ඡේදයේ අතුරු විධානයට ඉක්බිති වම පහත දැක්වෙන වැඩිදුරටත් වූ අතුරු විධානය එකතු කිරීමෙන් :—

"එසේ ම තවදුරටත් බොල් ණය හෝ අඩමාන ණය සම්බන්ධයෙන් (ඖඖ) ඡේදයෙහි සඳහන් ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව විසින් හෝ ජාතික සංවර්ධන බැංකුව විසින් මේ ඡේදය යටතේ අඩු කරනු ලැබිය හැකි යම් මුදලක්, අවස්ථාවෝචිත පරිදි (ඖඖ) ඡේදයෙහි සඳහන් ඒ සංස්ථාවේ හෝ ඒ බැංකුවේ ඒ ඒ පොදු සංචිත වලින් අඩු කරනු ලැබිය හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබිය යුතු ය. තව ද ඒ පොදු සංචිතයෙහි මුදල ඉක්මවන යම් අතිරික්තයක් වෙතොත් ඒ අතිරික්තය මේ ඡේදය යටතේ අඩු කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ජජ) ඡේදය (ට) ඡේදය වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියේ නැවත අක්ෂර යොදන ලද (ට) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ඩ) 32(2) වන වගන්තියේ සඳහන් යම් මුදලක් ගෙවීම සඳහා යම් සංචිතයකට හෝ ප්‍රතිපාදන යකට පවරන ලද (23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඩ) ඡේදයෙහි සඳහන් යම් වාර්ෂික ගෙවීමක් නොවන) යම් මුදලක් ; ".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (1) වන උපවගන් තියේ අතුරු විධානයේ " (අ) ඡේදයෙහි සඳහන් " යන වචන වෙනු වට " (අ) ඡේදයෙහි හෝ (අඅ) ඡේදයෙහි හෝ (අඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅ) ඡේදයෙහි හෝ සඳහන් " යන වචන ආදේශ කිරී මෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ (VIII) වන පරිච්ඡේදයේ " බදු අනු ප්‍රමාණ " යන වචන වෙනුවට " බදු අනුප්‍රමාණ සහ බදු බැර " යන වචන ආදේශ කිරීමෙන් ඒ පරිච්ඡේදයේ ශිර්ෂය මෙයින් සංශෝ ධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ VIII වන පරිච්ඡේදයේ ශිර්ෂය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (iii) වන ඡේදය, (iv) වන ඡේදය සහ (v) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

" (iii) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඅ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව; හෝ

(iv) 1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඅ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ; හෝ

(v) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1988 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIආ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව; හෝ

(vi) 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඇ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව;" තවද

(2) ඒ වගන්තියේ (3ඈ) උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3ඈ) යම් තැනැත්තකුගේ බදු අයකළ හැකි ආදායමෙහි, ඒ තැනැත්තා විසින් වෙනත් යම් තැනැත්තකු වෙතින් ත්‍යාග කිරීමෙන් හෝ උරුමවීමෙන් අත් කර ගන්නා ලද යම් නිශ්චල දේපලක අයිතිය සම්බන්ධයෙන් වූ වෙනස්වීමකින් උද්ගත වන ප්‍රාග්ධන ලාභ කිසිවක් ඇතුලත් වන අවස්ථාවක, මේ වගන්තියේ (3අ) උපවගන්තියේ සහ (3ආ) උපවගන්තියේ හෝ 14 වන වගන්තියේ (අ) ඡේදයේ (XVI) වන අනුඡේදයේ කාර්ය සඳහා, පළමුව සඳහන් තැනැත්තා විසින් ඒ දේපල අත්කර ගැනීමේ දිනය දෙවනුව සඳහන් තැනැත්තා විසින් ඒ දේපල අත්කර ගැනීමේ දිනය ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉ අලුත් වගන්තියක් ඇතුලත් කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඈ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 32ඉ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

"සේවා නියුක්තියෙන් ලබන ලාභ සම්බන්ධයෙන් බදුවලට ප්‍රතිපක්ෂව බදු බැර කිරීම.

32ඉ. 67 වන වගන්තියේ (7) වන උපවගන්තියේ විධිවිධානයන් අදාළ වන පුද්ගලයකු නොවන යම් පුද්ගලයකුගේ, 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා තක්සේරු කළ හැකි ආදායමේ, යම් සේවානියුක්තියකින් ලබන්නා වූ ලාභ (එම ලාභයේ 32(2) වන වගන්තියේ සඳහන් යම් මුදලකින් සමන්විත වන්නා වූ යම් කොටසක් වේ ද එම කොටස හැර) අඩංගු වන අවස්ථාවක, එම පුද්ගලයා විසින් එම තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු වන ආදායම් බද්දෙන්, රුපියල් නව සියයක මුදලක් හෝ, සේවානියුක්තියෙන් ලබන එම ලාභවලට ආරෝපනය කරනු ලැබිය හැකි වන ආදායම් බදු මුදල, යන මේ දෙකින් කවර වූ හෝ අඩු මුදල, අඩු කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්යයන් සඳහා, 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයකුගේ සේවා නියුක්තියෙන් ලබන එම ලාභවලට ආරෝපනය කරනු ලැබිය හැකි වන ආදායම් බදු මුදල, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ සේවා නියුක්තියෙන් ලබන ලාභයට, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායම, දරන අනුපාතයම වන අනුපාත

යක්, යම් මුදල් ප්‍රමාණයකට ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයා විසින් ගෙවිය යුතු වන ආදායම් බදු මුදල දරන්නේ ද එම මුදල් ප්‍රමාණය විය යුතු ය.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (ආ) ඡේදයේ (i) වන අනු ඡේදයේ "සියයට තිස් තුනයි තුනෙන් එකකට; සහ" යන වචන වෙනුවට "සියයට තිස් තුනයි තුනෙන් එකකට:" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) අනුඡේදයෙහි "1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1990 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(iii) ඒ තක්සේරු වර්ෂය 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් නම්, සියයට පනහළොව කට;";

(ඈ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඇ) (මෙහි මින් මතු "අදාළ තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ණයක් නොවන ආකාරයකින් ආණ්ඩුව විසින් ප්‍රාග්ධනයෙන් සියයට හැත්තෑ පහකට නො අඩු ප්‍රමාණයක් සලස්වනු ලබන යම් රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට එහි ලාභවලින් (අ) ඡේදය යටතේ ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද අඩු කිරීමෙන් පසුව ඒ තක්සේරු වර්ෂය සඳහා වූ එහි ලාභවල ශේෂයෙන් සියයට විසි පහකට සමාන මුදලක් විය යුතු ය:

එසේ වුව ද 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සංස්ථාවේ බදු අය කළ හැකි ආදායම ආගණනය කිරීමට පදනම් කරගත් ලාභවලින් අදාළ තක්සේරු වර්ෂයේ දී බෙදාහරිනු ලැබූ යම් දළ ලාභාංශවල එකතු ප්‍රමාණය—

(i) ඒ ශේෂයෙන් සියයට විසිපහකට වඩා අඩු නොවන අවස්ථාවක, මේ ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය ; තවද

(ii) ඒ ශේෂයෙන් සියයට විසිපහකට අඩු වන අවස්ථාවක, අදාළ තක්සේරු වර්ෂය සඳහා ඒ රාජ්‍ය සංස්ථාව මේ ඡේදය යටතේ යටත් වන බද්ද, ඒ ශේෂයෙන් සියයට විසිපහක, එම ලාභාංශවල එම ප්‍රමාණය ඉක්මවන අතිරික්තයට සමාන මුදලක් විය යුතුය.

මේ ඡේදයේ කාර්ය සඳහා, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ලාභවලට ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් වූ එනි ලාභ ඇතුළත් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.” සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ “නිල ලැයිස්තුගත පොදු සමාගම” යන්නෙහි අර්ථකථනය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33අා වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33අා වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ “සුදුසුකම් ලබන බෙදාහැරීමකින් සමන්විත වන්නේ ඒ ලාභාංශයේ යම් කොටසක් ද ඒ කොටසට ආරෝපණය කරනු ලැබිය හැකි අන්තිකාරම් බද්දේ එකතුවට සමාන මුදල් ප්‍රමාණයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.” යන වචන වෙනුවට “ඒ ලාභාංශයට ආරෝපණය කරනු ලැබිය හැකි අත්තිකාරම් සමාගම් බද්දෙන් එකතුවට සමාන මුදල් ප්‍රමාණයක් වශයෙන් සැලකිය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන් ; තව ද

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ “එම ලාභාංශයෙහි යම් කොටසක් සුදුසුකම් ලබන බෙදා හැරීමකින් සමන්විත වන්නේ නම්, එම කොටස මත ගෙවන ලද අත්තිකාරම් සමාගම් බද්දට සමාන මුදලක්” යන වචන වෙනුවට “එම ලාභාංශයට ආරෝපණය කරනු ලැබිය හැකි අත්තිකාරම් සමාගම් බද්දට සමාන මුදලක්” යන වචන ආදේශ කිරීමෙන් ;

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "1980 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක ඒ ප්‍රමාණයෙන් සියයට තිස්තුනයි තුනෙන් එකකට සමාන ආදායම් බද්දක් සහ 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක ඒ ප්‍රමාණයෙන් සියයට විස්සකට සමාන ආදායම් බද්දක් අඩු කර ගැනීමට හිමිකම් තිබිය යුතු ය;" යන ඉලක්කම් සහ වචන වෙනුවට—

"(අ) 1980 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක, ඒ ප්‍රමාණයෙන් සියයට තිස්තුනයි තුනෙන් එකකට ;

(ආ) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1990 අප්‍රේල් මස 1 වන දිනට පෙර ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක, ඒ ප්‍රමාණයෙන් සියයට විස්සකට ; සහ

(ඇ) 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක, ඒ ප්‍රමාණයෙන් සියයට පහළොවකට

සමාන ආදායම් බද්දක් අඩු කර ගැනීමට හිමිකම් තිබිය යුතු ය:" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඊ) (ඇ) ඡේදයේ (ii) වන හෝ (iii) වන හෝ (iv) වන අනුඡේදයේ සඳහන් ලාභාංශයකින් ගෙවනු ලබන ඒ ලාභාංශයේ කොටසක් සම්බන්ධයෙන් වෙනත් වාසික සමාගම් විසින් ගෙවන ලද අත්තිකාරම් සමාගම් බද්ද."; තවද

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ—

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "ඔහුට ලැබිය යුතු ය; තව ද" යන වචන වෙනුවට "ඔහුට ලැබිය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1990 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ ප්‍රමාණය සියයට විසිපහකින්

වැඩි කළ යුතු අතර, එකී සියයට විසිපහට සමාන ප්‍රමාණයක් ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කිරීමේ හිමිකම් ඔහුට ලැබිය යුතු ය; තව ද" සහ

(ඇ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඇ) 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ ප්‍රමාණය සියයට දාහතෙන් තුන කින් වැඩි කළ යුතු අතර එකී සියයට දාහ තෙන් තුනට සමාන ප්‍රමාණයක් ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කිරීමේ හිමිකම ඔහුට ලැබිය යුතු ය;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "8 වන වගන්තියේ (ඇ) ඡේදයේ කාර්ය සඳහා" යන ඉලක්කම් සහ වචන වෙනුවට "8 වන වගන්තියේ (ඇ) ඡේදයේ සහ 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ කාර්ය සඳහා" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ XII වන පරිච්ඡේදයේ දැක්වෙන ශීර්ෂය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියට පෙරාතුව ම දැක්වෙන ශීර්ෂයේ "සංචාරක ව්‍යාපාර සහ අපනයන කටයුතු හා සම්බන්ධ සමාගම්වල" යන වචන වෙනුවට "සංචාරක ව්‍යාපාර සහ අපනයන කටයුතු හා සම්බන්ධ තැනැත්තන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 85අ වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයේ හැර අන් සෑම තැනකම

"සමාගමක" යන වචනය වෙනුවට "තැනැත්තකුගේ" යන වචනය ද "සමාගම විසින්" යන වචන වෙනුවට "තැනැත්තා විසින්" යන වචන ද; "සමාගමට" යන වචන වෙනුවට "තැනැත්තාට" යන වචන ද, ආදේශ කිරීමෙන්;

(2) එහි (ආ) ඡේදයේ—

(අ) (i) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(i) වාසික සමාගමක් සම්බන්ධයෙන් වන විට එම තක්සේරු වර්ෂය සඳහා එම සමාගමේ මුළුලාභ සහ ආදායම එම සමාගමේ අපනයන ලාභ සහ ආදායමට

දරන අනුපාතයම වන අනුපාතයක්, එම සමාගම එම තක්සේරු වර්ෂය සඳහා, 82 වන වගන්තිය හෝ 83 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ගෙවිය යුතු වන ආදායම් බද්දට යම් මුදලක් දරන්නේ ද එම මුදල;

(ආ) එහි (ii) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

(ii) නිර්වාසික වන සමාගමක් සම්බන්ධයෙන් වන විට, එම තක්සේරු වර්ෂය සඳහා එම සමාගමේ මුළු ලාභ සහ ආදායම එම සමාගමේ අපනයන ලාභ සහ ආදායමට දරන අනුපාතයම වන අනුපාතයක්, එම සමාගම එම තක්සේරු වර්ෂය සඳහා 82 වන වගන්තිය හෝ 83 වන වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන යම් සහනයක් අඩු කිරීමෙන් පසු 34 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ ගෙවිය යුතු වන ආදායම් බද්දට යම් මුදලක් දරන්නේ ද, එම මුදල; සහ

(ඇ) එහි (ii) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

(iii) සමාගමක් නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට එම තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තාගේ මුළු ලාභ සහ ආදායම එම තැනැත්තාගේ අපනයන ලාභ සහ ආදායමට දරන අනුපාතයම වන අනුපාතයක්, එම තැනැත්තා ම තක්සේරු වර්ෂය සඳහා 82 වන වගන්තිය හෝ 83 වන වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන යම් සහනයක් අඩු කිරීමෙන් පසු ගෙවිය යුතු වන ආදායම් බද්ද, යම් මුදලකට දරන්නේ ද එම මුදල

ඉන් අදහස් වේ.”.

(3) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි “ අපනයන කටයුතුවල නිරත සමාගම්වල ” යන වචන වෙනුවට “ අපනයන කට යුතුවල නිරත තැනැත්තන්ගේ ” යන වචන ආදේශ කිරීමෙන්.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තියේ (2අ) උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තිය සංශෝධනය කිරීම.**

“ (2ආ) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ හෝ (2අ) උපවගන්තියේ සඳහන් යම් විස්තරයක්, යම් ප්‍රභවයකින් ව්‍යුත්පන්න වූ ආදායමේ මුදලට අදාළ වෙතොත්—

(අ) ඒ ආදායම් ප්‍රභවයට අදාළව නිතිපතා ගිණුම් පවත්වා ගෙන යනු ලබන්නේ නම්, ඒ ගිණුම් අනුව ආගණනය කරනු ලැබූ මුදල විය යුතු ය, තවද

(ආ) ඒ ආදායම් ප්‍රභවයට ආදාළව නිතිපතා ගිණුම් පවත්වා ගෙන යනු නොලබන්නේ නම්, වාර්තාව සපයන තැනැත්තා විසින් ඒ ප්‍රභවයෙන් මතුත් පන්න වූ ආදායමේ මුදල ලෙස සද්භාවයෙන් විශ්වාස කරන මුදල විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තියේ (2) වන උප වගන්තියේ අතුරු විධානයේ (ii) වන ඡේදයේ "මේ ඡේදයේ කාර්යය සඳහා" යන වචනවල සිට ඒ ඡේදයේ අවසානය තෙක් වූ සියලු වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"මේ ඡේදයේ කාර්යය සඳහා "ආදායම් බද්ද" යන්න,—

(අ) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ තක්සේරු වර්ෂය සඳහා 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු බද්ද ඊට ඇතුළත් නොවිය යුතු ය ; තව ද,

(ආ) 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ තක්සේරු වර්ෂයට ඉහතින් වූ තක්සේරු වර්ෂය (එය මෙහි මින් මතු "ඉහතින් වූ වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලැබේ) සඳහා, (පදිංචි නිවාසයක ශුද්ධ වාර්ෂික වටිනාකම සහ මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද යම් සහනාධාරයක් හැර) මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ යම් ලාභ සහ ආදායම සම්බන්ධයෙන් කර තිබුණු නිදහස් කිරීමක් ඉහතින් වූ වර්ෂයේ දී නතර කරන ලදුව ඒ ආදායම සහ ලාභ ඒ තැනැත්තාගේ බදු ගෙවිය යුතු ආදායම් ආගණනය කිරීමේ දී ඒ තක්සේරු වර්ෂය සඳහා ගණන් ගනු ලැබ තිබුණේ නම්, ඒ ආදායම් වර්ෂයට ඉහතින් වූ වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුව තිබුණු ආදායම් බද්ද ඉන් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය සංශෝධනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඇඇ) කිසිම දේපළ තහනමට ගැනීමක් ක්‍රියාත්මක කරනු නොලැබුව ද යම් පැහැර හරින්නකුට විරුද්ධව මේ වගන්තිය යටතේ කටයුතු කරගෙන යාමේ දී යම් නිලධරයකු විසින් දරන ලද යුක්තිසහගත වියදම් ඔහු විසින් ඒ පැහැර හරින්නාගෙන් අයකර ගැනීම නීත්‍යනුකූල වන්නේ ය.".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම.

"අයිතිකරු" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන්:—

"හවුල් ව්‍යාපාරය" යන්නෙහි, යම් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකුගේ බෙදිය හැකි ලාභයේ හෝ බෙදිය හැකි අලාභයේ කොටස වෙනත් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් සමග හවුලේ බෙදා ගනු ලැබීම පිණිස වූ යම් නියාදනය කිරීමක්, භාරයක්, ප්‍රදානයක්, ප්‍රතිඥාවක්, ගිවිසුමක්, පැවරීමක්, බේරුම් කිරීමක් හෝ වෙනත් වැඩපිළිවෙළක් ඇතුළත් නොවන්නේ ය.".

23. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ IV වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ කොටසේ (ආ) ඡේදයේ "1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1990 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ කොටස අවසානයේ දී පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්:—

"(ඇ) 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

පළමුවන රු. 200,000 සම්බන්ධයෙන්—කිසිවක් නැත.
ඊළඟ රු. 50,000 සම්බන්ධයෙන්—සියයට 05
ඊළඟ රු. 50,000 සම්බන්ධයෙන්—සියයට 10
ඉතිරි කොටස සම්බන්ධයෙන්—සියයට 15.".

24. (1) මේ පනතේ 7 (1) වගන්තියෙන් සහ 7 (2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 (1) වන වගන්තියට කරන ලද සංශෝධනය 1987 මාර්තු මස 6 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

අතීතයට බලපෑම.

(2) පිළිවෙළින් මේ පනතේ 11 (1) වන වගන්තියෙන් සහ 11 (2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 (2) වන වගන්තියට (පළමුවන උපලේඛනයේ II ඇ කොටසට අදාළ වන තාක් දුරට) සහ 32 (3ඇ) වගන්තියට කරන ලද සංශෝධන 1988 මාර්තු මස 25 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ 13 (1) (ඇ) වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 (1) (ඇ) වගන්තියට කරන ලද සංශෝධනය 1985 දෙසැම්බර් මස 31 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) පිළිවෙළින් මේ පනතේ 14 වන වගන්තියෙන් සහ 15 (2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 ආ වගන්තියට සහ 38 (2) වන වගන්තියට කරන ලද සංශෝධන 1988 සැප්තැම්බර් මස 8 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

25. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.